# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2010/18 – 2017 මාර්තු මස 14 වැනි අඟහරුවාදා – 2017.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මල් විසිතුරු පැල, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 33 (1) (අ) වගන්තිය යටතේ, කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ අංක 1916/12 දරන 2015.05.27 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය අනුව කම්කරු කොමසාරිස් එම්. ඩී. චාන්දනී අමරතුංග වන මම මල් විසිතුරු පැල, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තයේ නියුක්ත පහත උපලේඛනයේ සඳහන් සේවකයන් සම්බන්ධයෙන් වන දෛනික අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33(2) වන වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව මෙයින් නිවේදනය කරමි.

මෙම යෝජිත තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2017 අප්‍රේල් මස 07 වන දින මධ්‍යාහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරෝධතාවයක්ම එසේ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G 25273 – 17 (2017/03)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මල් විසිතුරු පැල, එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තයේ නියුක්ත සේවකයන්ට දෛනික අවම වේතන ප්‍රමාණය පහත දැක්වෙන පරිදි විය යුතුය.

| සේවක කාණ්ඩ | අවම දෛනික වේතනය |
|---|---|
| පුහුණු | 500/- |
| අර්ධ පුහුණු | 460/- |
| නුපුහුණු | 400/- |

03 – 1188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.